# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2458/29 - 2025 ඔක්තෝබර් මස 14 වැනි අඟහරුවාදා - 2025.10.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කේඩීඑස්/ටීයූඑම්/4/1/6/1/3/68.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2021/එච්ඩබ්ලිව්/384.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 301 ගලගෙදර බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගලගෙදර ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් 321271, කලාප අංක 01, පත්‍ර අංක 2 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල :

**කැබලි අංක 01**

ඉඩමේ නම: පල්ලෙගෙවත්ත; විස්තරය : විවෘත මුඩුබිම; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්ලිව්. යූ. එස්. ඩබ්ලිව්. කේ විජේරත්න; ප්‍රමාණය: හෙක්. 0.0044.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 නොවැම්බර් මස 24 වැනි දින පෙ. ව. 10.00 ට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 නොවැම්බර් මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

**ආර්. එම්. එස්. එන්. රත්නායක,**
ප්‍රාදේශීය ලේකම්,
තුම්පනේ.

2025 සැප්තැම්බර් මස 29 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0153